**ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය - 2022**

**----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන අගය රු.695,190ක් වූ සහ 2018 මාර්තු 29 දින මිලදී ගනු ලැබූ රු.189,600ක් වූ පරිගණක උපාංග අයිතම 36 ක් 2021 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණි. මෙම පරිගණක සහ උපාංග තවදුරටත් භාවිතා කරන බැවින් ප්‍රත්‍යාගණනය කර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. | පරිගණක උපාංග ප්‍රත්‍යාගණන කර ගිණුම් කරන දෝෂය නිවැරැදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | පරිගණක සහ උපාංග ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදුකල යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන වියදම් තුළ නිලධාරීන් දෙදෙනෙකුගේ රු.684,019ක් වූ හිඟ වැටුප් හා ඊට අදාළ ගෙවීම් ඇතුළත් වී තිබුණි. එම වැටුප් හා වේතන වියදම් තුළ ඉකුත් වර්ෂයට අදාළ වියදම රු.648,637කි. මෙම වියදම සහ එම වැටුප් හා වේතන වලට අදාළ සේවක අර්ථ සාධක අරමුදලේ ආයතනයේ දායකත්වය රු.77,836ක් සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය රු.19,459ක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ඌණතාවය රු.745,632ක් වැඩියෙන් දැක්විණි. | සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන වියදම් ගිණුම් වලට ගලපා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි | ගණුදෙනු හා සිදුවීම් වලට අදාළ මූල්‍ය ප්‍රකාශන සැඳහුම් නිවැරදිව දැක්වෙන පරිදි කාල පරිච්ඡේදයට අදාළව ගිණුම්ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) වටිනාකම රු.175,770ක් වූ තොග අයිතම දෙකක් අවසන් තොගයට නොගැනීමත්, කල් ඉකුත් පිරිවැය වටිනාකම රු.358,204ක් වූ රසායන ද්‍රව්‍ය තොග අයිතම 12ක් අවසන් තොගයට ඇතුළත් කර තිබීමත් හේතුවෙන් අවසන් තොගය හා වර්ෂයේ අතිරික්තය රු.182,434කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම්වලට ගලපා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි | ගනුදෙනු හා සිදුවීම්වලට අදාළ මූල්‍ය ප්‍රකාශන සැඳහුම් නිවැරදිව දැක්වෙන පරිදි කාල පරිච්ඡේදයට අදාළව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ)2023 අප්‍රේල් 20 දින විගණන නිලධාරීන් විසින් සිදු කරන ලද පරීක්ෂාවේදී ඉකුත් වර්ෂවල මිලදීගත්, දිනය සහ වටිනාකම හඳුනාගත නොහැකි අයිතමයන් 42 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් වලට ගලපා නිවැරදි කර ගැනීමට කටයුතු කරමි | වටිනාකම් තක්සේරුකර ගිණුම්වලට ගැලපීම් කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ 880 (1) සහ මු.රෙ 881 | 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප අඥා පනතට අනුව ඇප තැබිය යුතු වුවත් එසේ ඇප තැබිය යුතු කිසිදු නිලධාරියෙකුගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට අස්ථිත්වය කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැබීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | අංක 01 රජයේ නිවාසය 2017 වර්ෂයේ රු.4,337,274 ක මුදලක් වැයකර අළුත්වැඩියා කිරීමෙන් පසු එම වර්ෂයේ සිට එකී නිවස | මෙම නිවස සභාපතිවරයා වෙනුවෙන් වෙන්කල නිවසක් පමණක් නොවන අතර අවශ්‍යතා අනුව | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල |

| | | |
|---|---|---|
| පදිංචිය සඳහා ආයතනයේ රාජකාරී පැවරෙන සභාපති වරයාට ලබාදීම සිදු කර තිබුණි. | ප්‍රභූවරුන් වෙතද ලබාදීම සිදු කරයි. ඒ අනුව ප්‍රභූන් පැමිණි අවස්ථාවේදී ගාස්තු අයකිරීමක් සිදු කළ නොහැකි බව දන්වමි. | යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,193,030ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,251,969 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,941,061 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ව්‍යාපෘතිවලින් මාරු කිරීම රු.26,312,248කින් අඩුවීමද, සැපයුම් හා පාරිභෝජ්‍ය වියදම් රු.2,320,336 කින් සහ වැටුප් හා වේතන වියදම් රු.5,741,431කින් වැඩිවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ඉංජිනේරු අංශය විසින් 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද පසු අස්වනු යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සම්බන්ධ NVQ 3 හා 4 මට්ටමේ සහතික පත්‍ර පාඨමාලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පාඨමාලාවේ විෂය නිර්දේශ සකස් කිරීම හා සංවිධාන කටයුතු වෙනුවෙන් රු.178,062 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එවැනි පාඨමාලා පවත්වා නොතිබුණි. | ආයතනය තුල මෙම පාඨමාලාවේ සියළු කොටස් ආවරණය කිරීමට අවශ්‍ය කාර්යය මණ්ඩල හා භෞතික සම්පත් නොමැති වීම එම පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වීමට බලපා ඇත. | ආයතනයේ විෂය පථයට අරමුණුවලට හා ධාරිතාවයට ගැලපෙන පරිදි වූ පාඨමාලා පමණක් ආරම්භ කළ යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2018 අප්‍රේල් 05 දින රු.1,290,000 ක් වැය කර Gps Trackers unit 100 ක් හා 2018 මාර්තු 22 දින රු.4,680,000 ක් වැයකර Tempered Data Lorggers 130 ක් මිලට ගෙන තිබුණි. 2023 පෙබරවාරි 24 දින වන විටත් ඉන් Gps Trackers Unit 72 ක් හා Tempered Data Lorggers 09 ක් භාවිතයට නොගෙන ගබඩාවේ පැවතුණි. අදාළ උපකරණ ඵලදායී ලෙස භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් එම | 2019 වර්ෂයේ එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණු බැවින් අපේක්ෂිත ලෙස අදාල උපකරණ සියල්ල භාවිතා කල නොහැකි විය.<br><br>ඉදිරි කාලයේදී එම සියළු උපකරණ ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිතය. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |

ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ මුදල ආර්ථික නොවූ වියදමක් බවට පත්වී තිබීම.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට සැලසුම් කර රු.543,338 ක් වැය කර තිබූ ''Design & Construction Of A Tunnel Type Forced – Air Cooler For Cooling Of Fresh Mango'' පර්යේෂණ ව්‍යාපෘතිය විගණිත දිනවූ 2023 පෙබරවාරි 24 දිනවන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොවිය. | පර්යේෂණය සඳහා මිලදී ගත් බෙල්ට් කන්වේයරය සහ රසායන ද්‍රව්‍ය වෙනත් පර්යේෂණ සඳහා භාවිතා කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන අයුරින් කටයුතු කල යුතුය. |
| (ආ) ජාතික පසු අස්වනු කළමණාකරන ආයතනයේ ක්‍රියාත්මක පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණක් වේ. නමුත් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී 2000 වර්ෂයේ සිට විගණිත දින වූ 2023 මාර්තු 20 දින දක්වා වූ වර්ෂ 23 ක කාලය තුළ යාන්ත්‍රික වැඩපොළේ පවත්වාගෙන යන නිෂ්පාදිත යන්ත්‍ර සහ උපකරණ ලේඛනය අනුව එළිදක්වා ඇති නව උත්පාදන යන්ත්‍ර වර්ග 19 න් සමාජගත කර පැවතියේ එක් යන්ත්‍රයක් පමණක් විය. | බොහෝ යන්ත්‍ර අවුරුදු 10 කට වඩා පැරණි අතර මේ වන විට මෙම යන්ත්‍ර වලට වඩා ක්‍රියාකාරී යන්ත්‍ර බිහි වී ඇති බැවින් යන්ත්‍ර සමාජ ගත කිරීමේ අපහසුතාවයක් පවතී. | සමාජ අවශ්‍යතාවය හඳුනාගෙන යන්ත්‍ර නිපදවීමට හා සාමාජගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව පර්යේෂණවල අවසන් වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු එම පර්යේෂණ පිළිගත් සඟරාවක පලකිරීම හෝ සමුළුවකට ඉදිරිපත් කිරීම කළ යුතු වුවද 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ 20 ක් පිළිගත් සඟරාවක පල කිරීම හෝ සමුළුවකට ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂණ පිළිගත් සඟරාවක හෝ සමුළුවක ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | පර්යේෂණ වාර්තා පිළිගත් සඟරාවක හෝ සමුළුවකට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) පර්යේෂණ සඳහා ලබා දී තිබූ නියමිත කාලරාමුව තුළ අවසන් වාර්තා ලබා දිය යුතු වුවද පර්යේෂණ කාලරාමුව අවසන් වී ඇති පර්යේෂණ 05 ක් සඳහා අවසන් වාර්තා විගණිත දින වූ 2023 පෙබරවාරි 24 දින වන විටත් ලබා දී නොතිබූ අතර ප්‍රමාද කාලය වසර 02 ත් 05 ත් අතර විය. | අවසන් වාර්තා 02 ක් විවිධ හේතු මත ඉදිරිපත් කර නොතිබූ අතර වාර්තා 03 ක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | පර්යේෂණ අවසන් වාර්තා කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2015 වර්ෂයෙන් පසු ආරම්භ කර මේ වන විට අවසන් කර ඇති සමාජීය වශයෙන් කාලීන වැදගත්කමක් සහිත පර්යේෂණ ව්‍යාපෘති 04 ක සොයාගනු ලැබූ ප්‍රතිඵල වෙනත් සංවර්ධන ව්‍යාපෘති මගින් හෝ ව්‍යාප්ති කාර්යාල මගින් සමාජ ගත කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම තුලින් එම පර්යේෂණ ව්‍යාපෘති තුලින් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි. | පර්යේෂණ ප්‍රතිඵල සමාජගත කිරීමට පියවර ගනිමින් සිටි. | පර්යේෂණ ප්‍රතිඵල කඩිනමින් සමාජගත කළ යුතුය. |
| (ඊ) | පර්යේෂණ අංශය මගින් පර්යේෂණ ක්‍රියාවලියකින් පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණ වුවද 2000 වර්ෂයේ සිට විගණන දිනය දක්වා පේටන් බලපත්‍රය යන්ත්‍ර හා උපකරණ 09 ක් සඳහා පමණක් ලබාගෙන තිබුණි. | අප ආයතනය පේටන්ට් ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබුවේ 2012 වර්ෂයේ සිටය. එම කාලයෙන් පසු නිෂ්පාදන සඳහා පේටන්ට් ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි. | පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කෘෂි භෝග වල පසු අස්වනු හානිය අවම කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වූ අතර ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිදුකර තිබූ මූලික සමීක්ෂණයකට අනුව කල් තබාගත නොහැකි කෘෂි භෝගවල පසු අස්වනු හානිය සියයට 30ත් සියයට 40ත් අතර පැවති බව හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට එම සමීක්ෂණය සිදුකර වසර 12 ක කාලයක් ගතවී තිබූ අතර 2022 වර්ෂය වන විට එම පසු අස්වනු හානිය අවම කරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද යන්න හඳුනාගත හැකිවන අන්දමේ දත්ත සමුදායක් ආයතනය සතුව නොවීය. | පසුගිය කාලය පුරා ශ්‍රී ලංකාවේ කෘෂිබෝග වල පසු අස්වනු හානියේ ප්‍රමාණාත්මතාව අඩුකර ඒවායේ ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දින වන විට රසායනාගාරයේ පැවති එකතු වටිනාකම රු.8,336,705ක් වූ Atomic Absorption Spectrophotometer සහ Handel Wheel Vertical Autoclave යන්ත්‍ර | මෙම යන්ත්‍ර 02 අළුත්වැඩියාව සඳහා යන්ත්‍ර 02හි වටිනාකමටත් වඩා එනම් රු.මි 10.5 පමණ මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එබැවින් ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යංශයෙන් මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කළද ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම | යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතයට ගන්නා සැලසුම් ගත වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| 02 ක අක්‍රියවීම හේතුවෙන් එකි යන්ත්‍රය භාවිතා කර කරනු ලබන පර්යේෂණ කටයුතු පිළිවෙලින් 2018 හා 2019 යන වර්ෂවල නවතා තිබුණි. මෙම යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට සැලසුම් ගත වැඩපිළිවෙලක් ආයතනය සතු නොවිණි. | සිදු නොවුණි. | |
| (ආ) ජාතික පසු අස්වනු තාක්ෂණ කළමනාකරණ ආයතනය විසින් සිදු කරනු ලබන පරීක්ෂණ කටයුතු සඳහා රසායනාගාරවලට අවශ්‍ය රසායනාගාර උපකරණ සීමිත අවශ්‍යතාවයන් මත මිලදීගෙන ඇතත් එකී උපකරණ භාවිතයට ගන්නා අවස්ථා අවම වීම මත එකතු වටිනාකම රු.7,878,705 ක් වූ උපකරණ 03 ක් ඌණ උපයෝජිතව පැවතුණි. මෙහිදී සිදු කරන පර්යේෂණ ප්‍රමාණය අඩුවීම එම උපකරණ භාවිතා කරන අවස්ථා අවම වීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ. | AAS යන්ත්‍රය 2015 වසරේ සිට 2018 වසර දක්වා දිගටම විශ්ලේශණ කටයුතු සඳහා භාවිතා කර ඇති බව දන්වා සිටිමි. නමුත් පසුගිය වර්ෂයේදී මෙම යන්ත්‍රය අක්‍රීයව පැවතීම නිසා භාවිතා කර නොහැකිව ඇත. මෙහි දක්වා ඇති අනෙකුත් උපකරණද අවශ්‍යතාවය අනුව පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කර ඇත. | රසායනාගාර උපකරණ ඌණ උපයෝජිත නොවන අයුරින් භාවිතා කිරීමට සැලසුම්ගත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ද්විතික මට්ටමේ තනතුරු අතරින් කළමනාකරණ සහාකාර අනුමත තනතුරු 27 ක් වන අතර තත්‍ය කාර්යය මණ්ඩලය 22 කි. එම නිලධාරින් වෙත කාර්යභාරය පැවරීමේදී ආයතනය විසින් ඉටුකළ යුතු සමස්ථ කාර්යයසාධනය ඇඟයීමක් කර රාජකාරී පැවරීම ප්‍රශස්ථ මට්ටමකට ලඟාවෙන අයුරින් සිදුකර නොතිබුණි. පුරප්පාඩු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් දෙදෙනකුගේ සේවා දිගු අඛණ්ඩවම ලබාදී 2022 දෙසැම්බර් 31 දිනට රු.1,372,046ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත සහ තනතුරු 05 ක පුරප්පාඩු ඇති බැවින් සේවා දිගු ලබාදී ඇත. | විගණන නිරීක්ෂණය සමාලෝචනය කර ආයතන විසින් නිලධාරීන් වෙත කාර්යභාරයන් පැවරීම ප්‍රසස්ථ මට්ටමට ලඟාවෙන අයුරින් කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය තුළ PL 1 බාණ්ඩයේ සේවක | අධක්ෂ මණ්ඩල පත්‍රිකා BP 975 මගින් සිවිල් | විගණන නිරීක්ෂණයන් |

| | | |
|---|---|---|
| පුරප්පාඩු නොතිබියදී සහ මුරකරු තනතුර සඳහා අනුමත 06 ක් වූ සේවක සංඛ්‍යාව PL 1 බාණ්ඩයේ සේවකයින්ගෙන් සපුරාගත හැකිව තිබියදී අනුමත කාර්යමණ්ඩල වාර්තාවට අනුව ප්‍රධාන දොරටුවේ සේවයේ යොදවා සිටි මුරකරුවන් නේවාසිකාගාරයේ ගේට්ටුවේ ආරක්ෂක රාජකාරී සහ කාර්යාලයේ විවිධ රාජකාරී සඳහා යොදවා ප්‍රධාන දොරටුවේ මුරකරු රාජකාරි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂකයින් වෙතින් සපයා ගැනීම නිසා 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලය වෙනුවෙන් එම දෙපාර්තමේන්තුව වෙත රු.13,569,700 ක මුදලක් ගෙවා තිබුණි. | ආරක්ෂකයින්ගේ සේවය ලබාගන්නා ලදි. මුරකරුවන් කිහිපදෙනෙකු නේවාසිකාගාර පරිශ්‍රයේ ආරක්ෂාවට යොදවා ඇත. ආරක්ෂක කටයුතු ආයතනයේ මුරකරුවන් මඟින් සිදුකරගන්නේ නම් දැනට සිටින නිලධාරීන්ට අමතරව නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට අවසරය ලබාගත යුතුය. | සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සමාජ වගකීම් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07ක, බැරලෝහ වර්ග 04ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120ක වියදමක් දරා නියැදි 500ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic And Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරු කරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබීම හේතුවෙන් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබීම. | නියැදි 500 ක් විශ්ලේෂණය කර අවසන් වාර්ථාව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත බාරදී ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවසරය නොමැතිව වෙනත් පාර්ශව වෙත වාර්ථාව ලබා දීමට අවසර නොමැත. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වා දීමේ පර්යේෂණයේ (Induction Of Fruit Ripening By Organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715ක් වැය කර තිබුණද, විගණිත දිනය වූ 2023 පෙබරවාරි 24 දින වන විට මෙම ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොවීය. | කාබනික වගාවන් සඳහා සෞඛ්‍යාරක්ෂිත ඉදවීමේ ක්‍රමයක් ලෙස මෙම පර්යේෂණයෙන් හඳුනාගත් තාක්ෂණය යොදා ගත හැකි බව නිරීක්ෂණය විය. වානිජ මට්ටමේ ශක්‍යතාව අඩු නිසා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සිදු නොවිනි. | විගණන නිරීක්ෂණයන් සමාලෝචනය කර නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |